**පේදුරුතුඩුව නගර සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 13 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | 2020 වර්ෂයේ සිට ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කෙරේ. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) නගර සභා මූල්‍ය රීති මාලාවේ III පරිච්ඡේදය | | | | |
| (I) | 54(2) වගන්තිය | සභා ඉඩම්වල කුලි ගාස්තු නියමිත කාලය තුළ අයකර නොතිබුණි. | නියමිත මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| (II) | 54 (3) වගන්තිය | රු.13,443,582 ක් වටිනා හිඟ වරිපනම් බදු ගෙවීම පැහැර හැරී පුද්ගලයන්ට සභාපතිවරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | නියමිත නගර සභා මූල්‍ය රීතීන්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | සෑම බදු හිමියෙකු සඳහා වරෙන්තු නිකුත් කර තිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන උතුරු පළාත් මූල්‍ය චක්‍රලේඛය | සභාවේ වාහන 01 කට ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | නියමිත නගර සභා මූල්‍ය රීතීන්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |

## 2 මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 61,748,113 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 42,380,315 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,025,000 | - | 6,714,819 | 13,443,582 | 1,085,000 | - | 3,086,719 | 7,344,186 |
| කුලී | 10.600.000 | - | 9,897,279 | 1,222,492 | 17,000,000 | - | 8,751,103 | 1,281,268 |
| බලපත්‍ර ගාස්තු | 572.000 | - | 691,215 | - | 1,450,000 | - | 939,750 | - |
| වෙනත් ආදායම් | 76.088.000 | - | 39,259,210 | 24,795,755 | 68,781,500 | - | 10,230,513 | 42,322,867 |
| එකතුව | **93.285.000** | **-** | **56,562,523** | **39,461,829** | **88,316,500** | **-** | **23,008,085** | **50,948,321** |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු.23,008,085 ක් වුවත්, 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.56,562,523 ක් වීමෙන් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.33,554,523 කින් අඩු වී තිබූ බව නිරීක්ෂණය විය. එසේ වුවත්, බිල්කළ ආදායමත් දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හිඟහිට ලෙස දක්වා ඇති අගයන් සනාථ කළ නොහැකි විය. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | බිල්කළ ආදායම් සම්බන්ධයෙන් පිළිතුරු ලබා දී නොමැත. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ හිඟ දේපල බදු රු.13,443,582 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි මුදල් නියමිත කාලයේදී අයකර ගත යුතු වේ. | හිඟ වරිපනම් බදු අයකිරීමට කටයුතු කෙරේ. |

**2.2.4 කඩකුලී**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ හිඟ කඩ කුලී රු.1,222,492 ක් සභාව විසින් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් හිඟ කඩ කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | කඩ කුලී අයකරගෙන ඇත. |

**2.2.5 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සභා බල ප්‍රදේශයේ රු.35,802 ක් වටිනා දැන්වීම් පුවරු ස්ථාපිත කර තිබුණත් ඒ සඳහා බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි. | දැන්වීම් පුවරු ගාස්තු අදාළ කාල පරාසය තුළ අයකර ගත යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**2.2.6 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

**(අ) උසාවි දඩ**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.3,080,581 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ සිට හිඟ මුදල් අපට ලැබී ඇත. |

**(ආ) මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.4,872,715 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ සිට හිඟ මුදල් අපට ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහනගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත් සහ මහජන සුවය පහසුකම් සහ සුභසාධනය ආදී සභාවෙන් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 15 ක් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 15 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඝන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදාවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදුකළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් පවත්වා නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදුකළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සිදුකළ යුතු වේ. | ඉදිරියේදී කටයුතු කෙරේ. |
| (ii) | නගර සභාව විසින් ඝන අපද්‍රව්‍ය රාජකාරියේ යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන් 26 දෙනෙකුට වාර්ෂිකව සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණ පවත්වා නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදුකළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සිදුකළ යුතු වේ. | ඉදිරියේදී කටයුතු කෙරේ. |
| (iii) | සභාව විසින් ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේදී වෙන් නොකර එකටම රැස් කරනු ලැබේ. | ඝන අපද්‍රව්‍ය වෙන් කර එකතු කළ යුතුය. | ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීමේ සැලසුම් දැන් ක්‍රියාත්මක කර ඇත. |

**(ඇ) පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම් පිළිබඳ ක්‍රියාමාර්ග සිදු කළ යුතු වේ. | මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ උපදෙස් අනුව, බෝවීම මර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග සිදුකරමින් පවතී. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන සහකාරවරයා විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලපරිච්ඡේදයේ ඉදිරිපත් නොකිරීමෙන් නගර සභාවට අයත් වැදගත් කාර්යයක් ඉටු නොවී පැවතුණි. | පළාත් පාලන සහකාරවරයා විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නගර සභාව මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයකින් පසුව සිදු කර තිබුණි. | සභාව විසින් ජනතාවට සැලසිය යුතු සේවාවන් නියමිත කාලයේ සැලසිය යුතු වේ. | මහජන සේවා ලැයිස්තුව හඳුන්වා දීමට කටයුතු කෙරේ. |
| (ඇ) | සභාව විසින් රු.174,964,734 ක් වටිනා අරමුදල් ස්ථාවර තැන්පතුව නගර සභා බල ප්‍රදේශයට ඇතුළත් ප්‍රදේශ සංවර්ධන අරමුණු සඳහා උපයෝජනය නොකර ස්ථාවර තැන්පත් ලෙස පවත්වාගෙන ගොස් තිබුණි. | ස්ථාවර තැන්පතු ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා උපයෝජනය කළ යුතු වේ. | ස්ථාවර තැන්පතුවල පොලී ආදායම් සභාවේ සංවර්ධන කාර්යයන් සඳහා උපයෝජනය කෙරේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මානව සම්පත් ලබාගෙන යෙදවීම සිදුකර නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 21 ක් විසින් නිමකළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයට අයත් ඉඩම් සහ ඉදිකළ නිවාස, ගොඩනැගිලිවලින් වරිපනම් බදු අයකිරීමට වාර්ෂිකව සභාව විසින් දේපල හිමියන්ට K ආකෘති පත්‍ර ලබාදිය යුතු වුවත්, 2018 වර්ෂයේ දේපල 2,535 ක් සඳහා “K” ආකෘති පත්‍ර නිකුත් කර නොතිබුණි. | වරිපනම් බදු අයකිරීම සඳහා වාර්ෂිකව K ආකෘති පත්‍ර ලබාදිය යුතු වේ. | නිවාස හිමියන් විදේශගතව ඇති නිසා අදාළ අය වෙත සෘජුව භාරදිය නොහැකි තත්ත්වයක් උදා වී ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක NPRY – 5587 දරන වතුර බවුසරයත්, අංක NPGG – 2635 දරන රෝද දෙකේ ට්‍රැක්ටරයත් භාවිතා කළ නොහැකි වී තිබුණත් ඒවා අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | යන්ත්‍ර නිසි පරිදි අදාළ කාලවලදී අලුත්වැඩියාවන් සිදුකළ යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී |

**3.5.2 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ඉඩම් කොටස් 10 ක් සභාවේ නමට මාරු කර නොතිබුණි. | සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ඉඩම්වල ලේඛන ලබාගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**3.5.3 නිෂ්කාර්ය වත්කම්**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වතුර බවුසරයක් මුළුමනින්ම මලකඩ බැඳී නිෂ්කාර්යව පැවතුණු අතර මෙය අලුත්වැඩියා කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වත්කම් සම්බන්ධයෙන් අදාළ කාලපරිච්ඡේදය තුළ නඩත්තු කටයුතු සිදු කළ යුතු වේ. | වාහනයේ 2019 වර්ෂයේ වෙන්දේසි කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | නගර සභාවට අයත් කඩ කාමර සංකීර්ණයේ කඩ කාමර 3 ක් කුලියට ලබා දී නොතිබුණි. | සභාව සතු වත්කම් ඵලදායී ආකාරයෙන් උපයෝජනය කළ යුතු වේ. | ලංසු ලේඛන ලබාගැනීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවීම හේතුවෙන් මෙය මාරු ක්‍රමය පදනමින් ලබාදීමට කටයුතු කර ඇත. |

**4.** **ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1** **අයවැය පාලනය**

-------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ----------------------- | ----------------- | ----------------------------- |
| සභාවේ ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් හා තථ්‍ය පුනරාවර්තන වියදම් සමඟ සැසඳීමේදී රු.11,696,308 කින් අහිතකර ලෙස බලපා තිබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |